# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 4 දරන

# කොන්සල් කර්තව්‍ය පනත

---

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 පෙබරවාරි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල : ශත 65 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 4 දරන කොන්සල් කර්තව්‍ය පනත

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 59/80.

**ශ්‍රී ලංකාවේ තානාපති හා කොන්සල් නිලධරයන් විසින් විදේශීය රටවල ඇතැම් කොන්සල් කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා ද ඒ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා ගාස්තු නියම කිරීම හා අය කිරීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1981 අංක 4 දරන කොන්සල් කර්තව්‍ය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** සෑම තානාපති හෝ කොන්සල් නිලධරයකුට ම ශ්‍රී ලංකාවේ යම් ලිඛිත නීතියකට අනුකූලව, ඔහු පිළිගනු ලැබූ හෝ පත් කරනු ලැබූ යම් විදේශීය රටක යම් කොන්සල් කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමට මෙයින් බලය පවරනු ලැබේ: — තානාපති හෝ කොන්සල් නිලධරයන් විසින් කොන්සල් කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම.

එසේ වුවද, ඒ කර්තව්‍යය ක්‍රියාත්මක කරනු ලබන්නේ යම් රටක ද ඒ රටේ ලිඛිත නීති මගින් ඒ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම තහනම් කරනු ලැබ නො තිබිය යුතු ය.

**3.** ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන තැනැත්තකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීමකින් පසු තානාපති හෝ කොන්සල් නිලධරයකු විසින්— — ලේඛන වලංගු කිරීම හා පරිවර්තනය කිරීම.

(i) යම් ලේඛනයක් වලංගු කිරීම සඳහා සහතික කිරීම, සාක්ෂි දැරීම, සත්‍ය බවට සහතික කිරීම හෝ එවැනි වෙනත් යම් ක්‍රියාවක් කිරීම;

(ii) යම් ලේඛනයක් සිංහල හෝ දෙමළ භාෂාවෙන් වෙනත් යම් භාෂාවකට පරිවර්තනය කිරීම;

(iii) යම් ලේඛනයක් වෙනත් යම් භාෂාවකින් සිංහල හෝ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම;

(iv) සිංහල හෝ දෙමළ භාෂාවෙන් වෙනත් යම් භාෂාවකට කරන ලද පරිවර්තනයක නිරවද්‍යතාව සහතික කිරීම; හෝ

(v) වෙනත් යම් භාෂාවකින් සිංහල හෝ දෙමළ භාෂාවට කරන ලද පරිවර්තනයක නිරවද්‍යතාව සහතික කිරීම

කළ හැකි ය.

**4.** (1) සෑම තානාපති හෝ කොන්සල් නිලධරයකු ම නිල බල යෙන් ශ්‍රී ලංකා ජනරජය සඳහා සමාදාන විනිශ්චයකාරවරයකු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඔහු විසින් යම් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් ගැනීම හෝ යම් දිවුරුම් පත්‍රයක් ලබා ගැනීම කළ හැකි ය; තවද අවස්ථාවෝචිත පරිදි ඒ දිවුරුම හෝ ප්‍රතිඥාව හෝ ඒ දිවුරුම් පත්‍රය ගැනීම හෝ ලබා ගැනීම ශ්‍රී ලංකාවේ දී කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය. — දිවුරුම හෝ ප්‍රතිඥා ගැනීම හා දිවුරුම් පත්‍ර ලබා ගැනීම.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් ගන්නා හෝ දිවුරුම් පත්‍රයක් ලබා ගන්නා යම් තානාපති හෝ කොන්සල් නිලධරයකු ඒ දිවුරුම හෝ ප්‍රතිඥාව හෝ යටතේ කරන ලද හෝ ඒ දිවුරුම් පත්‍රයේ වාර්තා කරන ලද යම් ප්‍රකාශයක අන්තර්ගත කරුණුවල සත්‍යතාවය හෝ නිරවද්‍යතාවය ගැන වග කියනු නො ලැබිය යුතු ය.

විවාහය චාරිත්‍රානුකූලව සිදු කිරීම හා ලියාපදිංචි කිරීම.

**5.** (1) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වන අධිකාරය) හා උඩරට විවාහ හා දික්කසාද පනතේ (113 වන අධිකාරය) අර්ථානුකූලව සෑම තානාපති හෝ කොන්සල් නිලධරයකුම ශ්‍රී ලංකාවේ යම් දිස්ත්‍රික්කයක් සඳහා අතිරේක ප්‍රාදේශීය ලේකම්වරයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ තානාපති හෝ කොන්සල් නිලධරයා විසින්, යටත් පිරිසෙයින් විවාහයට සම්බන්ධ එක් පාර්ශ්වයක්වත් ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන අවස්ථාවක, ඒ විවාහය ශ්‍රී ලංකාවේ යම් දිස්ත්‍රික්කයක් තුළ චාරිත්‍රානුකූලව සිදු කරන ලද හා ලියාපදිංචි කරනු ලැබුවක් සේ සලකා, ඒ තානාපති හෝ කොන්සල් නිලධරයා පත් කරන ලද හෝ පිළිගන්නා ලද විදේශීය රටෙහි, අවස්ථාවෝචිත පරිදි, ඒ ආඥාපනත යටතේ හෝ පනත යටතේ යම් විවාහයක් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් චාරිත්‍රානුකූලව සිදු කිරීම හා ලියාපදිංචි කිරීම, ඒ ආඥාපනතේ 23 වන වගන්තියේ හා ඒ පනතේ 16 වන වගන්තියේ විධිවිධානයන් නොතකා, කළ හැකි ය.

(2) මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ (115 වන අධිකාරය) 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ තත්ත්වය පිළිබඳ වූ විධිවිධාන හැර, ඒ පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, සෑම තානාපති හෝ කොන්සල් නිලධරයකු ම ඒ පනතේ අර්ථානුකූලව රෙජිස්ට්‍රාර්වරයකු ලෙස සලකනු ලැබිය යුතු ය; තවද ඒ අනුව ඒ තානාපති හෝ කොන්සල් නිලධරයා විසින්, යටත් පිරිසෙයින් විවාහයට සම්බන්ධ එක් පාර්ශ්වයක්වත් ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන අවස්ථාවක හා පාර්ශ්වකරුවන් ශ්‍රී ලංකා වාසීන් වුව ද, නො වුව ද, ඒ විවාහය ශ්‍රී ලංකාවේ යම් දිස්ත්‍රික්කයක් තුළ ලියාපදිංචි කරන ලද ආකාරයෙන් ඔහු පත් කරන ලද හෝ පිළිගන්නා ලද විදේශීය රටෙහි ඒ පනත යටතේ යම් විවාහයක් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

(3) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ, උඩරට විවාහ හා දික්කසාද පනතේ හා මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ විධිවිධාන, (1) හා (2) වන උපවගන්තිවල සඳහන් කරන ලද විවාහය චාරිත්‍රානුකූලව සිදු කිරීම හා ලියාපදිංචි කිරීම හෝ විවාහය ලියාපදිංචි කිරීමට හා ඒ සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(4) සෑම තානාපති හෝ කොන්සල් නිලධරයකු ම (1) වන උපවගන්තිය යටතේ තම කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී අවස්ථාවෝචිත පරිදි විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ, උඩරට විවාහ හා දික්කසාද පනතේ, හා මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

6. (1) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 29 වන වගන්තිය යටතේ විවාහයක් තහනම් කරන ලද හෝ 30 වන වගන්තිය යටතේ කේවියට් තහනමක් කරන ලද අවස්ථාවක තානාපති හෝ කොන්සල් නිලධරයා විසින් ඒ ආඥාපනතේ 31 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන නොතකා, කිරීමට අපේක්ෂිතව තිබූ විවාහය චාරිත්‍රානුකූලව සිදු කිරීම සඳහා සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කොට විරෝධතාවය පිළිබඳ වාර්තාවක් කොළඹ දිස්ත්‍රික්කයේ දිසා විනිශ්චයකාරවරයා වෙත අප්‍රමාදව කරනු ලැබිය යුතු ය. ඒ වාර්තාව එකී ආඥාපනතේ පළමුවන උපලේඛනයේ 'ඔ' ආකෘතියේ විය යුතු අතර, එය විවාහ දැන්වීමේ හා විවාහය තහනම් කිරීමේ දැන්වීමේ හෝ කේවියට් තහනම කිරීමේ දැන්වීමේ පිට පතක් සමග විය යුතු ය.

විවාහය තහනම් කිරීමේ දී හෝ කේවියට් තහනමක දී නීති කෘත්‍යය.

(2) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 31 වන වගන්තියේ (2), (3), (4) හා (5) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් වාර්තාවකට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

7. (1) සෑම තානාපති හෝ කොන්සල් නිලධරයකු ම උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ (110 වන අධිකාරය) අර්ථානුකූලව ශ්‍රී ලංකාවේ යම් දිස්ත්‍රික්කයක් සඳහා අතිරේක ප්‍රාදේශීය ලේකම්වරයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ තානාපති හෝ කොන්සල් නිලධරයා විසින් ඔහු පත් කරන ලද හෝ පිළිගන්නා ලද විදේශීය රටෙහි සිදු වන ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ උපත හෝ මරණය ලියාපදිංචි කිරීම ශ්‍රී ලංකාවේ දී කරන ලද පරිද්දෙන් කළ හැකි ය.

උපත් හා මරණ ලියාපදිංචි කිරීම.

(2) උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් උපතක් හෝ මරණයක් ලියාපදිංචි කිරීමට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) සෑම තානාපති හෝ කොන්සල් නිලධරයකු ම (1) වන උපවගන්තිය යටතේ තම කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

8. අමාත්‍යවරයා විසින් කලින් කල ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයකින් එහි නියම කරනු ලබන කොන්සල් කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා තානාපති හෝ කොන්සල් නිලධරයකු විසින් අය කළ යුතු ගාස්තු නියම කළ හැකි ය.

කොන්සල් කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා ගාස්තු අය කළ යුතු බව.

9. (1) තානාපති හෝ කොන්සල් නිලධරයකු යම් කොන්සල් කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා වංචනික ලෙස හෝ ඕනෑකමින් කරන ක්‍රියාවකින් හෝ නො කර හැරීමෙන් දැනුවත්ව මුලා කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහාධිකරණයෙන් වරදකරු කිරීමෙන් පසු පස් අවුරුද්දක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පනස් දහසක් නො ඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩ මුදල යන දඬුවම් දෙකට ම යටත් වන්නේ ය.

වැරදි සහ දණ්ඩන.

(2) යම් තානාපති හෝ කොන්සල් නිලධරයකුගේ මුද්‍රාව හෝ අත්සන වංචනික ලෙස වෙනස් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහාධිකරණයෙන් වරදකරු කිරීමෙන් පසු අවුරුදු පහක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් වන්නේ ය.

(3) මේ වගන්තියේ සඳහන් කරන ලද යම් වරදක් 1977 අංක 8 දරන උදර්පන පනතේ 6 වන වගන්තියේ අර්ථානුකූලව උදර්පනීය වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය.

නියෝග.

10. (1) අමාත්‍යවරයා විසින්—

(අ) නියම කරනු ලැබීමට මේ පනතින් නියමිත කරුණක් ;

(ආ) මේ පනත යටතේ යම් ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි ;

(ඇ) මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කොන්සල් කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම

සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු අනුමතය සඳහා හැකි ඉක්මණින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නො කරන ලද යම් නියෝගයක් ඒ යටතේ ඉහතින් කරන ලද යම් දෙයකට හානි නොවන පරිදි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද සේ සලකනු ලැබිය යුතු ය. නියෝගයක් පරිච්ඡින්න කළ සේ සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"කොන්සල් කර්තව්‍ය" යන්නෙන් මේ පනතේ 3, 4, 5, 6 සහ 7 වන වගන්තිවල සඳහන් කරන ලද යම් කර්තව්‍යයක් අදහස් වන අතර, මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද යම් ක්‍රියාවක් ද ඊට ඇතුළත් වේ ;

"කොන්සල් නිලධරයා" යන්නෙන් එම තත්ත්වයෙන් කොන්සල් කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට පවරනු ලැබූ යම් තැනැත්තකු අදහස් විය යුතු අතර, කොන්සල් තනතුරක ප්‍රධානියෙක් ද ඊට ඇතුළත් වේ ;

(2) යම් තානාපති හෝ කොන්සල් නිලධරයකුගේ මුද්‍රාව හෝ අත්සන වංචනික ලෙස වෙනස් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහාධිකරණයෙන් වරදකරු කිරීමෙන් පසු අවුරුදු පහක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් වන්නේ ය.

(3) මේ වගන්තියේ සඳහන් කරන ලද යම් වරදක් 1977 අංක 8 දරන උදර්පන පනතේ 6 වන වගන්තියේ අර්ථානුකූලව උදර්පනීය වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය.

නියෝග.

10. (1) අමාත්‍යවරයා විසින්—

(අ) නියම කරනු ලැබීමට මේ පනතින් නියමිත කරුණක් ;

(ආ) මේ පනත යටතේ යම් ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි ;

(ඇ) මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කොන්සල් කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම

සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු අනුමතය සඳහා හැකි ඉක්මණින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නො කරන ලද යම් නියෝගයක් ඒ යටතේ ඉහතින් කරන ලද යම් දෙයකට හානි නොවන පරිදි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද සේ සලකනු ලැබිය යුතු ය. නියෝගයක් පරිච්ඡින්න කළ සේ සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"කොන්සල් කර්තව්‍ය" යන්නෙන් මේ පනතේ 3, 4, 5, 6 සහ 7 වන වගන්තිවල සඳහන් කරන ලද යම් කර්තව්‍යයක් අදහස් වන අතර, මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද යම් ක්‍රියාවක් ද ඊට ඇතුළත් වේ ;

"කොන්සල් නිලධරයා" යන්නෙන් එම තත්ත්වයෙන් කොන්සල් කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට පවරනු ලැබූ යම් තැනැත්තකු අදහස් විය යුතු අතර, කොන්සල් තනතුරක ප්‍රධානියෙක් ද ඊට ඇතුළත් වේ ;

"තානාපති නිලධරයා" යන්නෙන් දූත පිරිසක ප්‍රධානියකු හෝ ඒ දූත පිරිසේ තානාපති කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු අදහස් වේ; සහ

"ලේඛනය" යන්නෙන් වාණිජ හෝ නාවුක ලේඛනයක් අදහස් වන අතර, යම් අයිතිවාසිකමක් හෝ වගකීමක් හෝ නිර්මාණය කරන ලද, මාරු කරන ලද, සීමා කරන ලද, දීර්ඝ කරන ලද, අහෝසි කරන ලද හෝ වාර්තා කරන ලද හෝ එසේ නිර්මාණය කරන ලද, මාරු කරන ලද, සීමා කරන ලද, දීර්ඝ කරන ලද, අහෝසි කරන ලද හෝ වාර්තා කරන ලද යයි කියනු ලබන සෑම ලේඛනයක්ම ඊට ඇතුළත් වේ.

## උපලේඛනය

### කොන්සල් සම්බන්ධතා පිළිබඳ 1963 වියනා සම්මුතියේ V වන ව්‍යවස්ථාව

### කොන්සල් කර්තව්‍ය

කොන්සල් කර්තව්‍ය—

(අ) භාරගන්නා රාජ්‍යය තුළ ජාත්‍යන්තර නීතියෙන් අවසර දෙනු ලැබූ සීමා ඇතුළත යවන රාජ්‍යයෙහි හා එහි පුද්ගලයන් හා සංස්ථා යන ජාතිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම;

(ආ) යවන රාජ්‍යය හා භාරගන්නා රාජ්‍යය අතර වාණිජ, ආර්ථික, සංස්කෘතික හා විද්‍යාත්මක සම්බන්ධතා සංවර්ධනය තවදුරටත් දියුණු කිරීම හා එසේ නැතහොත් ඉහත සඳහන් කරන ලද සම්මුතියේ විධිවිධානවලට අනුකූලව ඔවුන් අතර මිත්‍ර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම;

(ඇ) සියළු නීත්‍යනුකූල මාර්ගවලින් භාර ගන්නා රාජ්‍යයෙහි වාණිජ, ආර්ථික, සංස්කෘතික හා විද්‍යාත්මක ජීවිතයෙහි තත්ත්වය හා සංවර්ධනයන් නිශ්චය වශයෙන් දැන ගැනීම, ඒ සම්බන්ධයෙන් යවන රාජ්‍යයෙහි ආණ්ඩුවට වාර්තා කිරීම හා සම්බන්ධතාවක් ඇති තැනැත්තන්ට තොරතුරු දැනුම් දීම;

(ඈ) යවන රාජ්‍යයෙහි ජාතිකයන්ට ගමන් බලපත්‍ර හා සංචාරක ලේඛන සහ යවන රාජ්‍යය වෙත සංචාරය කිරීමට අදහස් කරන තැනැත්තන්ට වීසා බලපත්‍ර හෝ උචිත ලේඛන නිකුත් කිරීම;

(ඉ) යවන රාජ්‍යයෙහි පුද්ගලයන් හා සංස්ථා යන ජාතිකයින්ට ආධාර කිරීම හා සහාය වීම;

(ඊ) භාර ගන්නා රාජ්‍යයෙහි නීති හා නියෝගවල, ඊට පටහැනිව කිසිවක් නොවේ නම් නොතාරිස්වරයකු හා සිවිල් රෙජිස්ට්‍රාර්වරයකු හා සමාන වර්ගයක තත්ත්වයෙන් ක්‍රියා කිරීම සහ පරිපාලන ස්වභාවයේ ඇතැම් කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම;

(උ) භාර ගන්නා රාජ්‍යයෙහි නීති හා නියෝගවලට අනුකූලව භාර ගන්නා රාජ්‍යයේ දේශය තුළ මරණාපේක්ෂක අනුප්‍රාප්ති අවස්ථාවල දී යවන රාජ්‍යයෙහි පුද්ගලයන් හා සංස්ථා යන ජාතිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම;

(ඌ) භාර ගන්නා රාජ්‍යයෙහි නීති හා නියෝගවලින් නියම කරන ලද සීමා ඇතුළත විශේෂයෙන් ඒ තැනැත්තන් සම්බන්ධයෙන් යම් පුද්ගල ආරක්ෂකත්වයක් හෝ භාරකාරත්වයක් අවශ්‍ය වූ අවස්ථාවක යවන රාජ්‍යයේ ජාතිකයන් වන බාලවයස්කාරයන්ගේ හා පූර්ණ තත්ත්වය නොමැති වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම;

(එ) භාර ගන්නා රාජ්‍යයෙහි පරිචයන් හා කාර්ය පටිපාටිවලට යටත්ව, යවන රාජ්‍යයෙහි ජාතිකයන්ගේ අයිතිවාසිකම් හා සම්බන්ධතා ආරක්ෂා කිරීම සඳහා තාවකාලික පියවර ගැනීමේ කාර්ය සඳහා, නොපැමිණීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඒ ජාතිකයන්ට නිසි වේලාවට තම අයිතිවාසිකම් හා සම්බන්ධතා ආරක්ෂා කර ගැනීමට නොහැකි වූ අවස්ථාවක භාර ගන්නා රාජ්‍යයෙහි නීති හා නියෝගවලට අනුකූලව භාර ගන්නා රාජ්‍යයෙහි විනිශ්චය සභා හා වෙනත් අධිකාර ඉදිරියෙහි යවන රාජ්‍යයෙහි ජාතිකයන් සඳහා නියෝජනය කිරීම හෝ සුදුසු නියෝජනයක් පිළියෙළ කිරීම;

(ඒ) බල පවත්නා ජාත්‍යන්තර ගිවිසුම්වලට අනුකූලව යවන රාජ්‍යයෙහි අධිකරණ වෙනුවෙන් සාක්ෂි ගැනීමට අධිකරණ හා බාහිර අධිකරණ ලේඛන යැවීම හෝ සාක්ෂි සටහන් කර ගැනීම සඳහා ලියවිලි හෝ අධිකාරපත්‍ර ලියා අත්සන් කිරීම හෝ එවැනි ජාත්‍යන්තර ගිවිසුම් නොමැති අවස්ථාවක භාර ගන්නා රාජ්‍යයෙහි නීති හා නියෝගවලට අනුකූල වෙනත් යම් ආකාරයකින් එසේ කිරීම ;

(ඔ) යවන රාජ්‍යයෙහි ජාතිකත්වය ඇති යාත්‍රා හා, එම රාජ්‍යයෙහි ලියාපදිංචි කරන ලද අහස්යාත්‍රා සම්බන්ධයෙන් හා ඒවායේ පිරිස සම්බන්ධයෙන් යවන රාජ්‍යයෙහි නීති හා රෙගුලාසිවලින් සලසා ඇති අධීක්ෂණ හා පරීක්ෂණ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම ;

(ඕ) (ඔ) උප ඡේදයේ සඳහන් කරන ලද යාත්‍රා හා අහස්යාත්‍රාවලට හා ඒවායේ පිරිසට සහාය දීම. යාත්‍රාවක යාත්‍රා ගමන පිළිබඳ ප්‍රකාශ ගැනීම, නෞකා ලියවිලි විභාග කිරීම හා මුද්‍රා තැබීම හා භාර ගන්නා රාජ්‍යයෙහි බලධරයන් ගේ බලතලවලට හානියක් නොවන පරිදි යාත්‍රා ගමනේදී සිදු වූ යම් සිද්ධීන් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම හා යවන රාජ්‍යයෙහි නීති හා නියෝග මගින් බලය පවරා ඇති ප්‍රමාණයට නෞකාධිපති, නිලධරයන් හා නාවියන් අතර ඇති වන යම් ආකාර ආරාවුල් නිරාකරණය කිරීම ;

(ක) භාර ගන්නා රාජ්‍යයෙහි නීති හා නියෝගවලින් තහනම් නොකරන ලද හෝ භාර ගන්නා රාජ්‍යය විසින් විරෝධයක් නොදක්වන ලද හෝ යවන රාජ්‍යය හා භාර ගන්නා රාජ්‍යය අතර බලාත්මකව පවතින ජාත්‍යන්තර ගිවිසුම්වල සඳහන් කරන ලද යවන රාජ්‍යය විසින් කොන්සල් තනතුරකට පවරන ලද වෙනත් යම් කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම

කොන්සල් කර්තව්‍යවලට ඇතුළත් වේ.